.

Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - සිංහල භාෂාව හා සාහිත්‍යය

2.සාම්ප්‍රදායික යෙදුම්

සතිය- 14

Prepared by- බි.කේ.ගුණරත්න

08 ශ්‍රේණිය

- පෙරසිට පැවතගෙන එන අවස්ථානුකූලව භාවිත කරන වචන සාම්ප්‍රදායික යෙදුම් නම් වේ
- සාම්ප්‍රදායික යෙදුම් වර්ග ගණනාවකි.ප්‍රස්තාව පිරුළු,රූඪී,යුගල පද)වශයෙනි.

1. ප්‍රස්තාව පිරුළු
    - ප්‍රස්තාව යනු අවස්ථාවයි.පිරුළු යනු කියමනයි.ඒ අනුව "අවස්ථාවට උචිත කියමන්",ප්‍රස්තාව පිරුළු නම් වේ.
    - මේවා රසවත් ය.,අලංකාරය.,සෑම පිරුළක් ආශ්‍රයෙන්ම කතාවක් ගොඩ නැඟී ඇත.

      උදා-: • පරංගියා කෝට්ටේ ගියා වගේ
      • ගහට ඉනි කැපුවා වගේ
      • වක්කඩේ හකුරු හැංගුවා වගේ
2. රූඪී
    - අමුතුවෙන් ආරෝපණය කරන ලද අර්ථ සහිත කියමන් හෝ ප්‍රකාශන රූඪී නම් වේ.
    - මේවාද අවස්ථානුකූලව භාවිත කරයි.

      උදා-: • ඉහේ මලක් පිපුණා
      • ලෑල්ලට පාගනවා
      • බඩට ගහනවා
3. යුගල පද
    - සමාන ශ්‍රැති සහිත පද දෙකක් ගැළපෙන ලෙස යෙදීමෙන් යුගල පද සෑදී ඇත.
    - මේ මගින් භාෂාව අර්ථවත් සහ අලංකාර වේ.

      උදා-: • යාන වාහන
      • හරක බාන
      • වතු පිටි

පැවරුම්

- පාඩමේ සඳහන් අභ්‍යාස කරන්න.
- සාම්ප්‍රදායික යෙදුම් යොදා කුඩා පොත් පිංචක් සකසන්න.
- සාම්ප්‍රදායික යෙදුම් යොදා වාක්‍ය 10 බැගින් නිර්මාණය කරන්න.